JMC vLearning
"your virtual learning partner"

# බැංකු සැසඳුම් ප්‍රකාශන

## AAT අදියර I
## FAC - මූල්‍ය ගිණුම්කරණය

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# බැංකු සැසඳුම් ප්‍රකාශන
## (Bank Reconciliation Statements)

**බැංකු සැසඳුම් ප්‍රකාශනයක් යනු ?**

කිසියම් කාලච්ඡේදයක් අවසානයේ දී ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමේ ශේෂයත් එකී කාලච්ඡේදය සඳහා අදාළ වාණිජ බැංකුව විසින් එවනු ලබන බැංකු ප්‍රකාශනයේ අවසාන ශේෂයත් අසමාන වූ අවස්ථාවක, එම අසමානතාවය සඳහා හේතු සොයාබලා එම හේතුන් ඇතුළත් කරමින් ඒවා තහවුරු කර ගැනීම සඳහා පිළියෙල කරනු ලබන ප්‍රකාශනය, බැංකු සැසඳුම් ප්‍රකාශනය නම් වේ.

බොහෝ ආයතන මෙම බැංකු සැසඳුම් ප්‍රකාශනය සෑම මාසයක් අවසානයේ දී ම පිළියෙල කරන අතර, ගිණුම්කරණ හා විගණන කටයුතුවලදී අත්‍යාවශ්‍ය ප්‍රකාශනයක් සේ භාවිතයට ගැනේ.

**ශේෂයන් වෙනස්වීම සඳහා බලපාන කරුණු.**

මෙකී අසමානතාවය සඳහා අදාළ වන හේතු ගණනාවක් ඇති අතර, එම හේතුන් පහත ප්‍රධාන කොටස් 03 යටතේ වෙන්කර දැක්විය හැක.

1. **කාල වෙනස්කම්.**

   එනම් ව්‍යාපාරයේ සහ වාණිජ බැංකුවේ කිසියම් ගනුදෙනුවක් වෙනස් වූ දිනයන් හි දී වාර්තාගත වීම නිසා හට ගන්නා වූ තාවකාලික වෙනස්කම් ය. මේ සඳහා පහත ප්‍රධාන හේතුන් අදාළ වේ.

   i. තැන්පත් කළ නමුත් නිෂ්කාශණය /උපලබ්ධි නොවූ චෙක්පත්.
   ii. නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත්.

2. **මගහැරීම්.**

   එනම් ප්‍රමාණවත් තොරතුරු නිසි පරිදි නොලැබීම නිසා ව්‍යාපාරයේ බැංකු ගිණුම (මුදල් ගිණුම) තුළින් මගහැරී යන්නා වූ ගනුදෙනුය. මේ සඳහා පහත හේතුන් අදාළ වේ.

   i. බැංකු අය කිරීම. - උදා : බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු, හර බදු, අයිරා පොළී
   ii. බැංකු ගෙවීම් - උදා: ස්ථාවර නියෝග යටතේ ගෙවීම.
   iii. සෘජු ප්‍රේෂණ - උදා : ණයගැති ප්‍රේෂණ, ආයෝජන ආදායම්

3. **වැරදි.**

   එනම් ගනුදෙනු ව්‍යාපාරයේ හෝ වාණිජ බැංකුවේ අදාළ ගිණුම්වල සටහන් වීමේ දී සිදුවිය හැකි දෝෂයක් ය.

**බැංකු සැසඳුම් ප්‍රකාශනයක අවශ්‍යතාවය**

1. කිසියම් කාලච්ඡේදයක් අවසානයේ ශේෂයන් වෙනස්වීම සඳහා අදාළ වූ හේතු සොයාගැනීමට හැකි වීම.
2. නිවැරදි බැංකු ශේෂය නොඉක්මවන පරිදි චෙක්පත් නිකුත් කිරීමට හැකි වීම.
3. චෙක්පත් අගරුවීම වළක්වා ගැනීමට හැකි වීම.
4. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ (මුදල් ගිණුමේ) දෝෂයන් හඳුනා ගැනීමට හැකි වීම.
5. වංචා, වැරදි සහ අක්‍රමිකතා අනාවරණය කර ගැනීමටත් අවම කර ගැනීමටත් හැකි වීම.
6. ආයතනය තුළ මනා කාරක ප්‍රාග්ධන කළමණාකරණයක් පවත්වා ගත හැකි වීම.

JMC vLearning
"your virtual learning partner"

## <u>සංශෝධිත මුදල් පාලන ගිණුම හා බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම.</u>

මේ සඳහා පහත පියවරයන් අනුගමනය කරන්න.

**පියවර 1-** ව්‍යාපාරයේ මුදල් ලැබීම් ජ'නලයේ ඇති තොරතුරු බැංකු ප්‍රකාශනයේ බැර (ලැබීම්) තීරුව සමඟ සන්සන්දනය කිරීම තුළින් වෙනස්කම් හඳුනා ගැනීම.

**පියවර 2 -** ව්‍යාපාරයේ මුදල් ගෙවීම් ජ'නලයේ ඇති තොරතුරු බැංකු ප්‍රකාශනයේ හර (ගෙවීම්) තීරුව සමඟ සන්සන්දනය කිරීම තුළින් වෙනස්කම් හඳුනා ගැනීම.

**පියවර 3 -** සංශෝධිත මුදල් පාලන ගිණුම පිළියෙල කිරීම.
මෙහිදී ඉහත පියවර 1 සහ 2 හි දී හඳුනා ගන්නා ලද වෙනස්කම් අතරින් මුදල් පාලන ගිණුමේ අවසාන ශේෂයේ තවදුරටත් සංශෝධනය විය යුතු වෙනස්කම් ගලපා ගැනීම සිදුවේ.

**පියවර 4 -** බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම.
මෙහිදී ඉහත පියවර 1 සහ 2 හි දී හඳුනාගත් වෙනස්කම් අතරින් මුදල් පාලන ගිණුමේ ශේෂය සංශෝධනයට අදාළ වෙනස්කම් හැර ඉතිරි වෙනස්කම් ගලපා ගැනීම සිදුවේ.

**<u>සටහන්</u>** : - බැංකු සැසඳුම් අභ්‍යාසවලදී ශේෂයන් වෙනස්වීම සඳහා අදාළ වන්නා වූ හේතූන් හඳුනාගෙන හේතු ලැයිස්තුවක් දී ඇති විට ඉහත සඳහන් පියවර 1 සහ 2 අනුගමනය කිරීම අවශ්‍ය නොවන අතර, පියවර 3 සහ 4 පමණක් අනුගමනය කිරීම ප්‍රමාණවත් ය.

මුදල් පාලන ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේ ආකෘතීන් පහත සඳහන් පරිදි වේ.

**සංශෝධිත මුදල් පාලන ගිණුම / මුදල් ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| මුදල් පාලන ගිණුමේ අවසාන ශේෂය | XXX | සටහන් නොවූ ස්ථාවර නියෝග | XXX |
| සටහන් නොවූ ඍජු ප්‍රේෂණ | XX | බැංකු අය කිරීම් | XX |
| අගරු වූ නිකුත් කළ චෙක්පත් | XX | අගරු වූ තැන්පත් කළ චෙක්පත් | XX |
| මුදල් පාලන ගිණුමේ වැරදි නිවැරදි කිරීම | XX | මුදල් පාලන ගිණුමේ වැරදි නිවැරදි කිරීම | XX |
| | | ශේෂය ප/ගෙ | XXX |
| | XXX | | XXX |
| ශේෂය ඉ /ගෙ | XXX | | |

**බැංකු සැසඳුම් ප්‍රකාශනය** රු.

| | | |
|---|---|---|
| සංශෝධිත මුදල් පාලන / මුදල් ගිණුමේ ශේෂය | | XXX |
| **එකතු කළා :** | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් | XX | |
| බැංකු ප්‍රකාශනයේ ඇති වැරදීම් | XX | XXX |
| **අඩු කළා :** | | |
| තැන්පත් කළ නමුත් නිෂ්කාශණය නොවූ චෙක්පත් | XX | |
| බැංකු ප්‍රකාශනයේ ඇති වැරදීම් | XX | (XX) |
| බැංකු ප්‍රකාශනය අනුව බැංකු ශේෂය | | XXX |

JMC Learning
"your virtual learning partner"

**උදාහරණ** -

මහේෂ් මහතාගේ ව්‍යාපාරයේ 2019 අප්‍රේල් මාසයට අදාළව මුදල් ලැබීමේ ජ'නලය, මුදල් ගෙවීමේ ජ'නලය හා මුදල් පාලන ගිණුම පහත පරිදි වේ.

**මුදල් පාලන ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 2019/04/01 ශේ/ඉ/ගෙ | 18 000 | ගැනුම් | 15 000 |
| විකුණුම් | 43 800 | ණයහිමි පාලන | 42 900 |
| ණයගැති පාලන | 50 200 | වියදම් | 5 500 |
| ආදායම් | 12 000 | වෙනත් ගෙවීම් | 9 000 |
| වෙනත් ලැබීම් | 30 000 | 2019/04/30 ශේ/ප/ගෙ | 81 600 |
| | 154 000 | | 154 000 |
| 2019/05/01 ශේ/ඉ/ගෙ | 81 600 | | |

**මුදල් ලැබීමේ ජ'නලය** රු.

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | දුන් වට්ටම් | වටිනාකම | ලැබීම් විශ්ලේෂණය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් | වෙනත් ලැබීම් |
| 2019/04/02 | විකුණුම් | 113126 | - | 15 000 | 15 000 | - | - | - |
| 2019/04/03 | සුසිර | 136213 | 500 | 10 000 | - | 10 000 | - | - |
| 2019/04/05 | විකුණුම් | - | - | 25 000 | 25 000 | - | - | - |
| 2019/04/08 | සාගර | 237418 | 800 | 10 200 | - | 10 200 | - | - |
| 2019/04/12 | ගෙවල් කුලී | - | - | 12 000 | - | - | 12 000 | - |
| 2019/04/17 | මනුක | 431511 | - | 17 000 | - | 17 000 | - | - |
| 2019/04/20 | ප්‍රාග්ධනය | - | - | 30 000 | - | - | - | 30 000 |
| 2019/04/25 | විකුණුම් | 511612 | | 8 300 | 8 300 | - | - | - |
| 2019/04/28 | සුසන්ත | 336508 | - | 13 000 | - | 13 000 | - | - |
| | | | 1 300 | 140 500 | 48 300 | 50 200 | 12 000 | 30 000 |

**මුදල් ගෙවීමේ ජ'නලය** රු.

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | ලද වට්ටම් | වටිනාකම | ගෙවීමේ විශ්ලේෂණය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වෙනත් වියදම් | වෙනත් ගෙවීම් |
| 2019/04/01 | ගැනුම් | 532140 | - | 8 000 | 8 000 | - | - | - |
| 2019/04/03 | කසුන් | 532141 | 600 | 10 400 | - | 10 400 | - | - |
| 2019/04/06 | ජලය | 532142 | - | 2 000 | - | - | 2 000 | - |
| 2019/04/07 | විදුලිය | 532143 | - | 3 500 | - | - | 3 500 | - |
| 2019/04/10 | ජයසිංහ | 532144 | - | 15 000 | - | 15 000 | - | - |
| 2019/04/15 | ගැනිලි | 532145 | - | 3 000 | - | - | - | 3 000 |
| 2019/04/20 | සුළු මුදල් | 532146 | - | 6 000 | - | - | - | 6 000 |
| 2019/04/22 | කුලතිලක | 532147 | 500 | 9 500 | - | 9 500 | - | - |
| 2019/04/24 | ගැනුම් | 532148 | - | 7 000 | 7 000 | - | - | - |
| 2019/04/25 | සුනිල් | 532149 | - | 8 000 | - | 8 000 | - | - |
| | | | 1 100 | 72 400 | 15 000 | 42 900 | 5 500 | 9 000 |

2019 අප්‍රේල් මාසයට අදාළ බැංකුවෙන් ලද බැංකු ගිණුම් විස්තරය පහත පරිදි වේ.

JMC vLearning
"your virtual learning partner"

**බැංකු ප්‍රකාශනය**

| දිනය | විස්තරය | හර රු. | බැර රු. | ශේෂය රු. |
|---|---|---|---|---|
| 2019/04/01 | ශේෂය | - | - | 18 000 |
| 2019/04/01 | චෙක් - 532140 | 8 000 | - | 10 000 |
| 2019/04/02 | චෙක් - 113126 | - | 15 000 | 25 000 |
| 2019/04/03 | චෙක් - 136213 | - | 10 000 | 35 000 |
| 2019/04/03 | චෙක් - 532141 | 10 400 | - | 24 600 |
| 2019/04/05 | මුදල් | - | 25 000 | 49 600 |
| 2019/04/06 | චෙක් - 532142 | 2 000 | - | 47 600 |
| 2019/04/07 | චෙක් - 532143 | 3 500 | - | 44 100 |
| 2019/04/08 | චෙක් - 237418 | - | 10 200 | 54 300 |
| 2019/04/10 | චෙක් - 532144 | 15 000 | - | 39 300 |
| 2019/04/12 | මුදල් | - | 12 000 | 51 300 |
| 2019/04/15 | චෙක් - 532145 | 3 000 | - | 48 300 |
| 2019/04/17 | චෙක් - 431511 | - | 17 000 | 65 300 |
| 2019/04/20 | මුදල් | - | 30 000 | 95 300 |
| 2019/04/20 | චෙක් - 532146 | 6 000 | - | 89 300 |
| 2019/04/21 | අගරු චෙක් - 431511 | 17 000 | - | 72 300 |
| 2019/04/22 | ලාභාංශ | - | 4 600 | 76 900 |
| 2019/04/22 | චෙක් - 532147 | 9 500 | - | 67 400 |
| 2019/04/28 | චෙක් පොත් ගාස්තු | 1 000 | - | 66 400 |
| 2019/04/29 | ණයගැති ප්‍රේෂණ | - | 3 000 | 69 400 |
| 2019/04/30 | රක්‍ෂණය (ස්ථාවර නියෝග) | 5 500 | - | 63 900 |

ඔබ විසින් ඉහත දක්වා ඇති විස්තර සැලකිල්ලට ගෙන පහත දෑ සකස් කරන්න.

1. මුදල් පාලන ගිණුමේ ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ 2019 අප්‍රේල් මාසය අවසානයේ බැංකු ශේෂය අතර වෙනස.
2. ශේෂයන් වෙනස් වීමට අදාළ හේතූන් කාල වෙනස්කම්, මඟහැරීම් හා වැරදි වශයෙන් වෙන්කොට දක්වීම.
3. ඉහත හඳුනාගත් හේතූන් ඇතුළත් කරමින් පහත දෑ පිළියෙල කරන්න.
   - i. සංශෝධිත මුදල් පාලන ගිණුම
   - ii. බැංකු සැසඳුම් ප්‍රකාශනය

ඉහත සාකච්ඡා කල අභ්‍යාසයේ දී ඇති බැංකු ප්‍රකාශනය, මුදල් පාලන ගිණුම, ලැබීම් ජ'නලය හා ගෙවීම් ජ'නලය සංසන්දනය තුළින් ශේෂයන් වෙනස්වීම සඳහා අදාළ හේතූන් හඳුනාගෙන ඉන් පසුව එම හේතූන් ඇතුළත් කරමින් පිළිතුර නිර්මාණය කරන ලදී. නමුත් බැංකු සැසඳුම් අභ්‍යාසය ඉදිරිපත් විය හැකි තවත් ආකාරයක් වන්නේ ශේෂයන් වෙනස්වීම සඳහා අදාළ හේතූන් කලින් හඳුනා ගෙන අභ්‍යාසය තුළ ඉදිරිපත් කර ඇති අවස්ථාවක බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කරන ලෙස ඉල්ලා සිටීමයි. මේ සඳහා පහත අභ්‍යාසය අධ්‍යයනය කරන්න.

**උදාහරණ :**

සීමාසහිත ස්විට්ස් රසකැවිලි සමාගමේ 2019/03/31 දිනට බැංකු ප්‍රකාශනයේ රු. 42 529 බැංකු අයිරා ශේෂයක් පෙන්නුම් කළ අතර, සමාගමේ මුදල් පාලන ගිණුමේ එදිනට රු. 15 274 ක හර ශේෂයක් පෙන්නුම් කළේ ය. මෙම ශේෂයන් වෙනස්වීම සඳහා බලපෑ හේතූන් පහත පරිදි වේ.

JMC VLearning "your virtual learning partner"

1) තැන්පත් කළ නමුත් 2019/03/31 දින දක්වා උපලබ්ධි නොවූ චෙක්පත්.

| | | | |
|---|---|---|---|
| චෙක් අංක 451123 | - | රු. | 156 200 |
| 174562 | - | රු. | 24 675 |

2) නිකුත් කළ නමුත් ගෙවීම සඳහා 2019/03/31 දින වන විටත් ඉදිරිපත් නොකළ චෙක්පත්.

| | | | |
|---|---|---|---|
| චෙක් අංක 437826 | - | රු. | 3 274 |
| 437835 | - | රු. | 115 248 |

3) නිකුත් කරන ලද චෙක්පත් අංක 437820 හි නිවැරදි වටිනාකම රු. 67 945 ක් වුව ද, පොත් තබන්නා විසින් එහි වටිනාකම රු. 69 745 ක් ලෙස මුදල් ගෙවීම් ජ'නලයේ වැරදි ලෙස ඇතුළත් කර ඇත.

4) 2019/03/31 දින බැංකුව විසින් අය කළ බැංකු ගාස්තු රු. 2 500 ක් මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.

5) 2019/03/31 දින බැංකුව විසින් වැරදීමකින් රු. 5 250 ක් සී/ස ස්වීට්ස් රසකැවිලි සමාගමේ ගිණුමට බැර කර ඇත.

**ඔබ විසින්,**

i. සංශෝධිත මුදල් පාලන ගිණුම හා

ii. බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

**<u>මුදල් පාලන ගිණුමේ ආරම්භක බැංකු ශේෂයත් බැංකු ප්‍රකාශනයේ ආරම්භක ගිණුම් ශේෂයත් අසමාන වූ අවස්ථාවක බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කිරීම.</u>**

මෙවැනි අවස්ථාවක පෙර මාසයේ පිළියෙල කරනු ලැබූ බැංකු සැසඳුම් ප්‍රකාශනය ඔබට අභ්‍යාසය තුළ දී තිබිය යුතු ය. නැතහොත් ආරම්භක ශේෂයන් අතර වෙනසට බලපාන ලද හේතූන් සපයා තිබිය යුතු ය.

දැන් ඔබ කළ යුත්තේ පෙර මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ පැවති අයිතම මෙම මාසයේ බැංකු ප්‍රකාශනයේ ඇතුළත් දැයි යන්න පරීක්ෂා කිරීම යි. එම අයිතමයන් මෙම මාසයේ බැංකු ප්‍රකාශනය තුළ ඇතුලත් වී නොමැති නම්, ඒවා මෙම මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශනයට ද ඇතුළත් කළ යුතු ය.

**උදාහරණ :**

පහත දැක්වෙන්නේ කවීන්ෂාගේ ව්‍යාපාරයේ 2019 මාර්තු මාසය සඳහා වූ මුදල් ලැබීමේ ජ'නලය, මුදල් ගෙවීමේ ජ'නලය, මුදල් පාලන ගිණුම හා බැංකු ප්‍රකාශනය වේ. එමෙන්ම 2019 පෙබරවාරි මාසය සඳහා පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශනය ද පහත පරිදි වේ.

**2019/02/28 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය** රු.

| | | |
|---|---|---|
| මුදල් පාලන ගිණුම අනුව ශේෂය | | 17 750 |
| (+) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ | | |
| චෙක් අංක - 00802 | 4 720 | |
| 00804 | 3 130 | 7 850 |
| (-) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ | | |
| චෙක් අංක - 10804 | 7 250 | |
| 11300 | 2 150 | (9 400) |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | 16 200 |

**මුදල් පාලන ගිණුම** රු.

| | | | |
|---|---|---|---|
| 2019/03/01 ශේෂය ඉ/ගෙ | 17 750 | ගැණුම් | 9 600 |
| විකුණුම් | 10 590 | ණයහිමි පාලන ගිණුම | 12 900 |
| ණයගැති පාලන ගිණුම | 5 260 | වියදම් | 3 100 |
| ආදායම් | 2 000 | 2019/03/31 ශේෂය ප/ගෙ | 10 000 |
| | 35 600 | | 35 600 |

JMC vLearning "your virtual learning partner"

### මුදල් ලැබීමේ ජ'නලය රු.

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | දුන් වට්ටම් | වටිනාකම | ලැබීම් විශ්ලේෂණය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් |
| 2019/03/05 | විකුණුම් | - | - | 4 140 | 4 140 | - | - |
| 2019/03/10 | සුමීර | 12567 | 340 | 5 260 | - | 5 260 | - |
| 2019/03/15 | විකුණුම් | 17341 | - | 6 450 | 6 450 | - | - |
| 2019/03/26 | ගෙවල් කුලී | 10153 | | 2 000 | - | - | 2 000 |
| | | | 340 | 17 850 | 10 590 | 5 260 | 2 000 |

### මුදල් ගෙවීම් ජ'නලය රු.

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | ලද වට්ටම් | වටිනාකම | ගෙවීමේ විශ්ලේෂණය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට ගැණුම් | ණයහිමි ගෙවීම් | වෙනත් වියදම් |
| 2019/03/06 | ගැණුම් | 00807 | - | 2 700 | 2 700 | - | - |
| 2019/03/16 | සසික | 00808 | 200 | 3 800 | - | 3 800 | - |
| 2019/03/21 | රසික | 00809 | - | 9 100 | - | 9 100 | - |
| 2019/03/26 | චේතන | 00810 | - | 3 100 | - | - | 3 100 |
| 2019/03/29 | ගැණුම් | 00811 | - | 6 900 | 6 900 | - | - |
| | | | 200 | 25 600 | 9 600 | 12 900 | 3 100 |

### බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර රු. | බැර රු. | ශේෂය රු. |
|---|---|---|---|---|
| 2019/03/01 | ශේෂය | - | - | 16 200 |
| 2019/03/02 | චෙක් - 10804 | - | 7 250 | 23 450 |
| 2019/03/05 | මුදල් | - | 4 140 | 27 590 |
| 2019/03/06 | රක්ෂණය | 2 550 | - | 25 040 |
| 2019/03/08 | චෙක් - 00807 | 2 700 | - | 22 340 |
| 2019/03/12 | චෙක් - 12567 | - | 5 260 | 27 600 |
| 2019/03/12 | චෙක් - 00802 | 4 720 | - | 22 880 |
| 2019/03/20 | ලාභාංශ | - | 1 000 | 23 880 |
| 2019/03/27 | චෙක් - 00809 | 9 100 | - | 14 780 |
| 2019/03/28 | බැංකු ගාස්තු | 730 | - | 14 050 |
| 2019/03/29 | චෙක් - 00810 | 3 100 | | 10 950 |
| 2019/03/30 | චෙක් - 00810 | - | 3 100 | 14 050 |

**ඔබ විසින්,**

i. සංශෝධිත මුදල් පාලන ගිණුම

ii. බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

JMC vLearning "your virtual learning partner"